# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 159 — 1975 අප්‍රේල් 11 වැනි සිකුරාදා — 1075.04.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (IIඅ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 423 | විභාග විභාග ප්‍රතිඵල ආදිය | 433 |


## තනතුරු—ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන රාජ්‍ය සෙවා පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සුදුසුකම් :**

1 : 1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි.

1 : 2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනෙක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම්කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

1 : 3 නියමිත සිංහල ප්‍රවීනතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාල තනතුරට හෝ සේවයට නිමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණ යෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නො ලැබේ.

**2. දීමනා :**

2 : 1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ 8 වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනාවක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප/වේතන ලබන ගණයට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය නැත මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

**3. සේවා කොන්දේසි—සාමාන්‍ය :**

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

**4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් මිස, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලයතුළ, හේතුවක් නොදක්වා සේවය කෙළවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකිවූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අන්දමේ දැනුමක් තමාගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළවන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයන් තාවකාලිකව අත්හිටවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මී නව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් විවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාලසීමාව අවසානයේ දී සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධිවිධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලබන අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4 සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූවිට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂාකර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත්කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබූවා වූ ද අය හැර) තෝරා ගනුලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

**5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

5 : 1 1972.01.01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් 9% ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6% ක් දක්වා වූ ස්වෙච්ඡාදායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971.12.31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972.01.01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් යථෝක්ත විශ්‍රාම වැටුප් හිමිකම් නොකඩවා භුක්තිවිඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

5 : 3 1971.12.31 දින රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන ලද 1972. 01. 01 දිනට පසුව පළාත් පාලන සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදා හරිනු ලැබූ නිලධාරීන් සහ 1971.12.31 දින පළාත් පාලන සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන ලද 1972. 01. 01 දිනට පසුව රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදා හරිනු ලැබූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයෙහි සහ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා ඔවුන් හට පෞද්ගලික වන සේ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

5 : 4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට 1972. 01. 01 දිනට පසුව මුදා හරිනු ලැබූ සහ 1971. 12. 31 දින විශ්‍රාම වැටුප් සහිත වූ හමුදා, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. කෙසේ වුවද, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔවුන්ගේ හමුදා, නාවික හා ගුවන් හමුදා සේවය ඔවුන්ගේ විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවය සමග විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගනු නොලැබේ.

**6. යුද්ධ සේවා අනුග්‍රහය :**

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත හටයින්ද සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට

තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්වී නොගිය අයට ද අහත කී සියලුම සුදුසුකම් තිබේනම් ද, ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු:**

7 : 1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූ ද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකිද, නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

7 : 2 නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් ඉහෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

7 : 3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුව අයථා අනුග්‍රහයක පැතීම හෝ එගිලා යම් බලපෑමක් කිරීමට තැත්කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

7 : 4 අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැන ගන්නට ලැබුණිනම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත් තෝරාගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනිනම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

7 : 5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම.**

8 : 1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවන් සඳහා වැටුප යන්නෙන අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ IV වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ IV වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 6,600—180×8 හා 240×6—රු. 9,480—(1969. 10. 01 දිනට පෙර අනුරූප කල්පිත වැටුප රු. 3,900—180/240—රු. 6,780) කි.

3. සේවා කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ අර්ථසාධක අරමුදලට මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු 3ක පරීක්ෂණ කාලයක් මතය. 1971. 12. 31 දින ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයක සිටි රජයේ සේවකයෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු විශ්‍රාම වැටුප් පදනමක් මත පත්කරනු ඇත.

4. අවශ්‍ය සුදුසුකම් :

(අ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්ත විය යුතුය.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් හා එයට අමතරව, ලංකා පුස්තකාල සංගමයේ මධ්‍යම පරීක්ෂණය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව (පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකමක් තිබීම ; සහ

(ඇ) ඉහත (ආ) හි සඳහන් සුදුසුකම් සමග අවුරුදු 10 ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම.

(ඈ) සිංහල හා ඉංග්‍රීසිද, රසායන විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් සමත්ව තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.

සටහන :

(1) IV වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපතින් වර්ෂයකට රු. 8,040 (ඒකාබද්ධ) වැටුප් ලක්ෂය ඉක්මවා යාමට පෙර ලංකා පුස්තකාල සංගමයේ අවසාන වර්ෂයේ හෝ ඒ සමග විභාගයකින් සමත් විය යුතුය.

(2) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ එයට සමාන හෝ උසස් සහතිකයක් සහිතව, ලංකා පුස්තකාල සංගමයේ මධ්‍යම පරීක්ෂණය හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව (පුස්තකාලයාධිපතිත්වය) පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකම් සමග අවුරුදු 10ක ප්‍රායෝගික පළපුරුද්දක් ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවක සින්ටද මේ තනතුර සඳහා ඉල්ලුම් කළ හැක.

5. වයස් සීමාව.—වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.

6. සියලුම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය පිළිගනු නොලැබේ).

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකවල පිටපත්.

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික පත් තුනක පිටපත්.

(iv) ප්‍රායෝගික පළපුරුද්ද සනාථ කිරීමට සහතිකයක්.

සැ. යු. :—මෙම සහතිකපත්වල මුල් පිටපත් අමුණා නොඑවිය යුතුයි.

7. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙළ කරන ලද අයදුම්පත් 1975 අප්‍රේල් මස 30 දින හෝ ඊට පෙර ලැබෙන සේ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

8. අයදුම්පත් හෝ ඊට අදාල සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙතය. කෘෂිකර්ම අධ්‍යක්ෂගේ හෝ කිසිඹු නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම්පත් හා ලියකියවිලි නො එවිය යුතුය. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) වැනි ඡේදයේ මුල් පිටුවේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාළ පොදු කොන්දේසි කෙරෙහිද අවධානය යොමු කරවනු ලැබේ.

ඊ. අබේරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1975 මාර්තු 20 දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ IV වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර ආකෘතිය**

(සැ. යු. ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "IV වන ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය" යන පාඨය සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය).

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුය)

(4) ජාතිය :————.

(5) විවාහකද, අවිවාහකද යන බව :————.

(6) අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිනිය යුතුය)

(7) ප්‍රායෝගික පළපුරුද්ද :————.
(සනාථ කිරීමට සහතිකයක් ඇමිනිය යුතුයි)

(8) පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

(9) ඊට කලින් රජයේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

(10) යම් කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදි කරු වී ඇත්නම් එම වරද සහ ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(11) චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :
————.

මවිසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙම අයදුම්පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එම හේතුවෙන් නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-166—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

අංකය : එස්. එච්. ඒ. 2/74.

**පොලිස් දෙපාර්තමේන්තුව**

**පොලිස් ගුවන් විදුලි අංශය—ප්‍රධාන කාර්මික නිලධාරි තනතුර**

පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්මික නිලධාරි තනතුරක් සඳහා අයදුම්පත් 75.07.28 කැඳවනු ලැබේ. පහත සපයා ඇති ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 75.04.05 දින හෝ ඊට පෙර ලැබෙන සේ නාරාහේන්පිට මධ්‍යම ගරාජයේ ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු අධ්‍යක්ෂ වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2. වැටුප් පරිමාණය.—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප රු. 6,600 වන අතර, රු. 180 බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් හා රු. 240 බැගින් වූ වැටුප් වැඩිවීම් 5 කින් පසුව රු. 8,040 ලඟාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව රු. 9,240 දක්වා වැඩිවේ.

3. වයස.—අයදුම්පත් අවසන් වන දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 20-35 අතර විය යුතුය.

4. අධ්‍යාපනික හා කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද :—

(අ) බ්‍රිතාන්‍ය ගුවන් විදුලි ඉංජිනේරු ආයතනයේ 1 වැනි කොටසේ සිට 3 වැනි කොටස දක්වා විභාගයේ සාමාර්ථ සහතිකය හෝ,

(ආ) ලංඩන් මැට්රිකියුලේෂන් සාමාර්ථ සහතිකය හෝ පහත සඳහන් විෂයන් සහිතව ලංඩන් සිටි සහ ගිල්ඩ් ආයතනයේ විභාගයේ සාමාර්ථ සහතිකය සහ ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළුව අ. පො. ස. උසස් පෙළ සහතිකය.

1. ගුවන් විදුලි 'සී' කොටස,

2. ලංඩන් මැට්රිකියුලේෂන් විභාගයේ උසස් ගණිතය පිළිබඳ සාමාර්ථය හෝ අ. පො. ස. (උසස් පෙළ) සාමාර්ථය හෝ,

(ඇ) ඉලෙක්ට්‍රොනික් විද්‍යාව පිළිබඳ පරීක්ෂණාගාර පළපුරුද්ද හා පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යාව හෝ ඉංජිනේරු අංශයේ අන්තර් පරීක්ෂණය සමත් වී සිටීම,

(ii) දෙපාර්තමේන්තු අයදුම්කරුවන් :—

පහත දැක්වෙන සුදුසුකම් හිමි අයදුම්කරුවෝ ඉහත දැක්වූ වයස් සීමාවන් පිළිබඳ සැලකීමක් නොමැතිව තෝරා ගැනීම සඳහා සුදුස්සන් වෙති.

(අ) දෙපාර්තමේන්තුවේ සේවා කාලය තුල වැඩ සහ හැසිරීම පිළිබඳ ආදර්ශවත් සේවා කාලයක්,

(ආ) රු. 5,304 වැටුප් තලයට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වී ඇති සහකාර කාර්මික නිලධාරියෙකු,

(ඇ) ලංඩන් හි සිටි සහ ගිල්ඩ් ආයතනයේ පහත සඳහන් විෂයයන් සමත් වී සිටීම :—

1. ගුවන් විදුලි 'අ' සහ 'ආ' කොටස

2. විදුලි සංදේශ මූල ධර්ම 'අ' කොටස

5. සේවයේ යෙදවීමේ නියමයන්.—(i) තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය.

(ii) තෝරාගත් අයදුම්කරු ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, පොලිස් දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය (මෙම විනය සංග්‍රහය සම්බන්ධයෙන් පමණක් තෝරාගත් අයදුම්කරු පොලිස් නිලධාරියෙකු වශයෙන් සැලකේ) හා පොලිස්පති විසින් හෝ රජය විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝගයන්ට යටත් විය යුතුයි.

6. පහත සඳහන් ලියවිලි සියල්ලකගේම හෝ එකක මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට දැන්වූ පසු ඔවුන් එසේ කල යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය. (සැ. යු.—උපකාරක පාඨශාලාවල රෙගුලාසි මාලාව වෙනුවෙන් නිකුත් කල භෞතිස්ම සහතිකය භාරගනු නොලැබේ.)

(ආ) ලබාගන්නා ලද අධ්‍යාපනික, කාර්මික හා වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට ඇති යෝග්‍යතාවය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික තුනක්,

සටහන.—අයදුම්පතට මුල් සහතික පත්‍ර ඇමිණිය නොයුතු අතර, පිටපත් පමණක් අමුණා එවිය යුතුයි.

7. මෙම ගැසට් නිවේදනයේ I වැනි කොටසේ (IIඅ) ඡේදයේ පළ කරනු ලද රාජ්‍ය සේවයේ තනතුරු සඳහා පත් කිරීමේදී බල පානු ලබන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

8. දැනටමත් රජයේ සේවයේ නියුතු අය තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. අවසාන දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්පත් නියම කරන ලද දින හෝ ඊට පෙර ප්‍රධානියා වෙත ලැබී නැත්නම් හා අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ප්‍රමාද වීමට පිළිගත හැකි හේතු සහිතව අයදුම්පත් භාර ගැනීමට නිර්දේශ නොකරන්නේ නම් එවැනි අයදුම්පත් භාරගනු නොලැබේ.

9. මෙම නිවේදනයට අනුකූල නොවන හා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන.—පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් ගෙවනු නොලැබේ.

ඩී. ඇස්. ටී. පී. ආර්. සේනානායක,
පොලිස්පති.

**ආදර්ශ අයදුම්පත් ආකෘතිය**
**පොලිස් ගුවන් විදුලි අංශය—ප්‍රධාන කාර්මික නිලධාරි තනතුර සඳහා අයදුම් පත**

1. නම සම්පූර්ණයෙන් :————.
(අ) පෙලපත් නාමය :————.
(ආ) අනෙකුත් නම් :————.

2. ස්ථිර ලිපි යොමුව :————.

3. (අ) උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ආ) 75.07.28 දිනට නියම වයස :—
අවුරුදු :——, මාස :——, දවස් :——.

4. ජාතිය :————.
(අ) ලාංකිකයෙකු වන්නේ පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචිවීමෙන්ද යන වග :————.
(ආ) පරම්පරාවෙන් නම් පහත සඳහන් අයගේ උපන් ස්ථාන සඳහන් කරන්න :————.
1. අයදුම්කරුගේ :————.
2. අයදුම්කරුගේ පියාගේ :————.
3. අයදුම්කරුගේ පිය පස මුත්තාගේ :————.
4. අයදුම්කරුගේ පියපස මී මුත්තාගේ :————.

5. විවාහකද, අවිවාහකද නැතහොත් වැන්දඹුද යන වග :————.

6. සුදුසුකම් :————.

(අ) අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

(ආ) ලබාගත් වෘත්තීය සහ කාර්මික සුදුසුකම් ඒවා ලබා ගත් දිනසහිතව :————.
(පිළිගත් ආයතනයක හිත්, වෘත්තියට අදාල සංගමයක හිත් සාමාජිකත්වයක් ඇතොත් එයද වෙනත් සුදුසුකම් ඇතොත් ඒවාද සඳහන් කිරීම මැනවි. සහතිකපත්වල පිටපත් ඇමිණිය යුතුයි.)

7. සිංහල පිළිබඳ ප්‍රවීණතාව :————.
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහාය.)

8. පාසලින් හෝ විද්‍යාලයෙන් අස්වූ දින සිට යෙදුණු රැකියාවන් (ඒවාට ඇතුළුවූ සහ ඒවායින් ඉවත් වූ දින සහිතව) :————.

9. නිර්දේශකයන් තුන්දෙනෙකුගේ නම් තනතුරු නාම සහ ලිපි යොමු සඳහන් කරන්න :————.

1.
2.
3.

10. ඉදිරිපත් කරනු ලබන චරිත සහතික දී ඇති සම්භාවනීය පුද්ගලයින් තුන්දෙනාගේ නම් සහ ලිපි යොමු :————.
(මෑතකදී ලබාගත් චරිත සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. ණය තුරුස් ආදී මුදල් කරදරවලින් නිදහස් ද යන වග එසේ නැතහොත් ඔබ කොයි තරම් දුරට ණය තුරුස් කරදරවලට භාජනය වී සිටින්නෙහිද යන වග :————.

12. කවර හෝ සාපරාධී වරදක් සඳහා ඔබට විරුද්ධව උසාවියක චෝදනා නගා තිබේද? එසේ නම් (අ) දින :——, (ආ) නඩු අංකය :——, සහ (ඇ) දඬුවමේ ස්වභාවය පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

13. රජයේ දෙපාර්තමේන්තුවක හෝ පෞද්ගලික අංශයේ/ මණ්ඩලයක /සංයුක්ත මණ්ඩලයක (මහ බැංකුව, ජනසතු කරන ලද බැංකු, වානිජ බැංකු, විශ්ව විද්‍යාල, රජයේ පාලනය යටතේ පවත්නා බද්ධ ව්‍යාපාර වස්තු වෙළඳ සමාගම් ආදිය) රැකියාවෙහි නියුක්තව සිටින ලද නම් එම රැකියාවෙන් ඉවත්වීමේ හේතු :————.

14. වෙනත් කවර හෝ විස්තර ඇතොත් ඒවා :————.
(විශේෂ ජයග්‍රහණ කිසිවක් ඇතොත්)

මා විසින් මේ අයදුම් පතෙහි සපයන ලද තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ නැතහොත් වැරදි බව ඔප්පු වුවහොත් තෝරා ගැනීමට පළමුවෙන් නම් නුසුදුස්සෙකු වීමටත්, සාවද්‍යතාව පත්වීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කවර හෝ වන්දියක් රහිතව සේවයෙන් පහ කරනු ලැබීමටත්, ඉඩ ඇති බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පොලිස් මූලස්ථානය, කොළඹ, 1,
1975 පෙබරවාරි මස 28 දින.

4-134—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

මාතලේ දිස්ත්‍රික්කයේ වගපණිහ උඩසිය පත්තුව කෝට්ඨාශයේ හදිසි දරණ පරීක්ෂක ධුරය

මාතලේ දිස්ත්‍රික්කයේ වගපණිහ උඩසිය පත්තුව කෝට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා මෙහි පහත 3 වැනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත්, 1975 මැයි මස 30 වැනිදාට හෝ ඊට පෙර මාතලේ දිසාපති වෙත එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත දැක්වෙන සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30කට නොඅඩු බව හා 55කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරුවන් ඉහත සඳහන් ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් වීම.

(ඇ) සිංහල භාෂාව සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවාරයකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ සහ අංක ගණිතය/මූලික ගණිතය සමග විෂයයන් 6කින් සමත්වී සිටීම.

(ඉ) මාසික ආදායම රුපියල් 200 ක් හෝ ඊට වැඩිවීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ, සංස්ථා සහ පළාත් පාලන ආයතනවල සේවකයින් මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට සුදුස්සෝ නොවෙති. පළාත් පාලන ආයතනවල නියෝජිතයින් මෙම තනතුරට පත්කරනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය.

සිරිල් ගමගේ,
මාතලේ දිසාපති.

1975 මාර්තු 24 දින,
මාතලේ දිසාපති කාර්යාලයේ දී ය.

මාතලේ දිස්ත්‍රික්කයේ වගපණිහ උඩසිය පත්තුව කෝට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපළවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. මාසික ආදායම :————

11. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

12. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද?————.

13. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-130—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

### මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේසිය පත්තුව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්‍ෂක ධුරය

මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේසිය පත්තුව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්‍ෂක ධුරය සඳහා මෙහි පහත 3 වැනි ඡේදයේ දක්වෙන සුදුසුකම් ඇති අපේක්‍ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 75 මැයි 30 වැනිදට හෝ ඊට පෙර මාතලේ දිසාපති වෙත එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් මරණ පරීක්‍ෂණයක් වෙනුවෙන් රුපියල් 10ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත දැක්වෙන සුදුසුකම් තිබෙන බවට සැහෙන සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 කට නොඅඩු බව සහ 55 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරුවන් ඉහත සඳහන් ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් වීම.

(ඈ) සිංහල භාෂාව සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ. පො. ස සාමාන්‍ය පෙළ විභාගයෙන් දෙවාරයකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ සහ අංක ගණිතය/මූලික ගණිතය සමග විෂයයන් 6 කින් සමත්වී සිටීම.

(ඉ) මාසික ආදායම රුපියල් 200 ක් හෝ ඊට වැඩිවීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ, සංස්ථා සහ පළාත් පාලන ආයතනවල සේවකයින් මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට සුදුස්සෝ නොවෙති. පළාත් පාලන ආයතනවල නියෝජිතයින් මෙම තනතුරට පත් කරනු නොලැබේ.

6. අයදුම්පත් ලැබුණු බවට දන්වීමක් කරනු නොලැබේ. අයදුම්පත් ලේඛණගත තැපෑලෙන් එවිය යුතුයි.

1975 මාර්තු 2 දින.
මාතලේ දිසාපති කාර්යාලයේ දී ය.

සිරිල් ගමගේ,
මාතලේ දිසාපති.

#### මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේසිය පත්තුව කොට්ඨාශයේ හදිසි මරණ පරීක්‍ෂක ධුරය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරින්) :———.

(2) ලිපිනය :———.

(3) ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :———.

(4) (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :———.

(ආ) උපන් දිනය සහ ස්ථානය :———.

(5) විවාහක අවිවාහක බව :———.

(6) අධ්‍යාපන සුදුසුකම් :———.

(7) දැනට කරන රක්‍ෂාව :———.

(8) මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.

(9) තමන් සතු දේපලවල වටිනාකම සහ ප්‍රමාණයන් විස්තර සහිතව :———.

(10) මාසික ආදායම :———.

(11) ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ———.

(12) ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :———.

(13) මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :———.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙසින් සහතික කරමි.

දිනය :———.

———,
අයදුම්කරුගේ අත්සන.

4-131—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

### දඹගල්ල කෝරළේ—දඹගල්ල මරණ පරීක්‍ෂක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්‍ෂක ධුරය

මොණරාගල දිස්ත්‍රික්කයේ දඹගල්ල කෝරළේ—දඹගල්ල මරණ පරීක්‍ෂක කොට්ඨාශයේ (මකුල්ල, දඹගල්ල හා ගල්බොක්ක ග්‍රා. සේ. කොට්ඨාශවල) හදිසි මරණ පරීක්‍ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පත් තමාගේ අත් අකුරෙන් සම්පූර්ණ කොට, 1975. 05. 30 දිනට හෝ ඊට පෙර ලේඛණගත තැපෑලෙන් මොණරාගල දිසාපති, කච්චේරිය, මොණරාගල යන ලිපිනයට එවිය යුතු ය.

2. මෙම තනතුර සඳහා වැටුප් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්‍ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් පමණක් ගෙවනු ලැබේ.

3. සුදුසුකම් :—

(අ) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නො අඩු 55 කට නො වැඩි විය යුතුයි.

(ආ) ඉල්ලුම්කරු දඹගල්ල කෝරළේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

(ඇ) යටත් පිරිසෙයින් සිංහල භාෂාව සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ දෙවාරයකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ සහ අංක ගණිතය/මූලික ගණිතය සහ විෂය යන් 6 කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

(ඈ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(ඉ) මාසික ආදායම රු. 200 හෝ ඊට වැඩි විය යුතු ය.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම් පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ප්‍රදේශයේ ස්ථිර පදිංචිය සනාථ කරන සහතිකය.

(ඇ) ලබා ඇති උසස් ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඈ) චරිතය පිළිබඳ මෑතක දී ලබා ගත් සහතික දෙකක්.

5. රජයේ හා සංස්ථාවල සේවකයින් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද, මෙම තනතුර සඳහා නුසුදුස්සන් බැවින්, ඔවුන්ගේ අයදුම්පත් භාර ගනු නො ලැබේ.

6. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නො ලැබේ.

1975 මාර්තු මස 21 දින,
මොණරාගල,
දිසාපති කාර්යාලයේදී ය.

ස. ජ. සුමණසේකර බණ්ඩා,
මොණරාගල දිසාපති.

ආදර්ශ ආකෘති පත්‍රය

#### දඹගල්ල කෝරළේ—දඹගල්ල මරණ පරීක්‍ෂක කොට්ඨාශයේ හදිසි මරණ පරීක්‍ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරෙන්) :———.

2. ලිපිනය :———.

3. ස්ථිර පදිංචිය හා එහි පදිංචි කාලය :———.

4. 1975. 05. 30 දිනට වයස :——.
අවුරුදු :———.
උපන් දිනය :———.
උපන් ස්ථානය :———.

5. විවාහක අවිවාහක බව :———.

6. අධ්‍යාපනික සුදුසුකම් :———.

7. දැනට කරන රක්‍ෂාව :———.

8. මීට පෙර රැකියාවක් කළේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.

9. තමන් සතු දේපලවල වටිනාකම සහ ප්‍රමාණය (විස්තර සහිතව) :———.

10. මාසික ආදායම :———
මෙම ආදායම ලැබෙන අන්දම :———.

11. ඉල්ලුම්කරු ණය ගැති ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.

12. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයෙන් දඬුවම් ලබා තිබේ ද? :———.

13. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත්, ඒ පිළිබඳ විස්තර :———.

ඉහත දක්වන ලද කරුණු සම්පූර්ණ සත්‍ය බව සහතික කරමි. පත් වීම ලැබුණහොත්, අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම එය අවලංගු වීමට හේතුවක් බව දනිමි.

දිනය :———.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

4-132—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

**මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් සහ කෝරළපත්තු කොට්ඨාශයේ (මීරාවෝඩයි) මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය**

එරාවූර් සහ කෝරළපත්තු (මීරාවෝඩයි) මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූද හෝ එයි පදිංචි වී සැහෙන දේපක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ විවාහක මුස්ලිම් පිරිමි අයවළුන්ගෙන් ඉහත සදහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 කට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශිය නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන, කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදියෙයි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලා ගත හැකිය.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1975. 05.09 වැනි දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ඇම්. අන්තෝනිමුත්තු,
අතිරේක දිසාපති සහ
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1975 මාර්තු මස 21 දින,
මඩකලපුවේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

4-158 —75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

**මන්නාරම නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

මන්නාරම නගරය කෝඩ්ඩුක්කාඩු හා තෝඩ්ඩවෙලි ග්‍රාම සේවක කොට්ඨාශ ආවරණය කරන මන්නාරම නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයන්ට ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1975 මැයි මස 5 දින හෝ ඊට පෙර මන්නාරම දිසාපති කාර්යාලයේ දිසාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 10 ක දීමනාවක් ගෙවනු ලැබේ.

3. සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 30 කට නො අඩු හා 55 කට නො වැඩි වීම.

(ආ) ඉල්ලුම්කරු ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුතු අයෙකු වීම.

(ඈ) දෙමළ භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය සමත්වීම හෝ සිංහල/දෙමළ, අංක ගණිතය/මූලික ගණිතය ඇතුළුව වාර දෙකකට නො වැඩි ගණනකදී විෂයයන් 6 ක් සහිතව අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත් වීම.

(ඉ) මාසික ආදායම රු. 200 ක් හෝ ඊට වැඩි විය යුතුය.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ පළාත් පාලන ආයතනවල, මණ්ඩලවල සහ සංස්ථාවල සේවකයන් ද පළාත් පාලන ආයතනවල නියෝජිතයන් ද මෙම තනතුරු සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. එසේ හෙයින් ඔවුන්ගේ ඉල්ලුම්පත් භාරගනු නො ලැබේ.

6. අයදුම්පත් ලේඛන ගත තැපෑලෙන් එවිය යුතු වේ. ඉල්ලුම් පත් ලැබී තෙදිනක් ඇතුලත ඒවා ලැබුණ බව ද දන්වනු ලැබේ.

7. මීට ප්‍රථම ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අය ඔවුන්ගේ ඉල්ලුම්පත් අළුත්වැඩියා කළ යුතුයි.

එන්. ජයනාදන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති.

1975 මාර්තු 25 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත

**මන්නාරම නගර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග පැහැදිලි අකුරිනි)

(2) ලිපිනය :————.

(3) ස්ථිර පදිංචිය, ස්ථානය හා එහි පදිංචි කාලය :————.

(4) (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය හා ස්ථානය :————.

(5) විවාහක අවිවාහක බව :————.

(6) අධ්‍යාපන සුදුසුකම් :————.

(7) දැනට කරන රක්ෂාව :————.

(8) මීට පෙර රැකියාවක් කළේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(9) තමන් සතු දේපොලවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

(10) දැනට ලැබෙන මාසික ආදායම :————.

(11) ඉල්ලුම්කරු ණයගැතිව සිටිද? එසේ නම් ඒ පිළිබඳව විස්තර :————.

(12) ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඩුවම් ලබා තිබේද?

(13) මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

4-152 —75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

**ජාතික ආධුනිකත්ව මණ්ඩලය**

කර්මාන්ත ශිල්පී ආධුනිකයන් බඳවා ගැනීම—1975

1975 වර්ෂය සඳහා කර්මාන්ත ශිල්පී ආධුනිකයන් බඳවා ගැනීම පිණිස පොරොත්තු ලේඛනයක ලියා පදිංචි කිරීමට ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් :—

1. (අ) අ—1 වර්ගයේ වෘත්තීන් සඳහා
සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් හයකින් සාමාර්ථය.

(ආ) අ—2 වර්ගයේ වෘත්තීන් සඳහා
රජයේ හෝ ආධාර ලබන හෝ අනුමත කරන ලද හෝ පාසලක 7 වැනි ශ්‍රේණියේ සාමාර්ථය

2. වයස අවුරුදු 18ට නො අඩු විය යුතුය.

අවශ්‍ය විස්තර තමන්ගේ නම සහ ලිපිනය ලියන ලද මුද්දරයක් සහිත 9"×4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ජාතික ආධුනිකත්ව අධ්‍යක්ෂ වෙත එවීමෙන් හෝ මෙම කාර්යාලයට පැමිණීමෙන් හෝ ලබාගත හැකිය.

ඩී. ජේ. නානායක්කාර,
සභාපති සහ වැඩ බලන ආධුනිකත්ව අධ්‍යක්ෂ.

1975 අප්‍රේල් මස 4 දින,
ජාතික ආධුනිකත්ව මණ්ඩලය,
3/2, තුරග තරග පිටිය මාවත,
කොළඹ—7.

4-200 —75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

### අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ පාසල්වලට දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ සමාජ විද්‍යා ඩිප්ලෝමා සහතික ලත් උපගුරුවරුන් බඳවාගැනීම—1975

පහත දැක්වෙන අධ්‍යාපන දිස්ත්‍රික්කවල ඡන්දකොට්ඨාශයන්හි පිහිටි රජයේ පාසල්වල උපගුරු තනතුරු සඳහා, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා ඩිප්ලෝමා සහතික ලත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අයදුම් කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව 8½"—11½" ප්‍රමාණයේ කඩදසියේ (දෙපිට) සකස් කර තම අත් අකුරින් පැහැදිලිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර 1975 මැයි මස 15 වෙනි දින හෝ ඊට පෙර 'ලේකම්, පාසල් පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, මැලේ වීදිය, කොළඹ 2' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතු ය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ ''සමාජ විද්‍යා ඩිප්ලෝමා උපගුරු තනතුරු'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අධ්‍යාපන දිස්ත්‍රික්ක හා ඒවාට අයත් ඡන්ද කොට්ඨාශ මෙසේය :—

| අධ්‍යාපන දිස්ත්‍රික්කය | ඡන්ද කොට්ඨාශය |
|---|---|
| 1. බණ්ඩාරවෙල... | ... 1. බණ්ඩාරවෙල |
| | 2. මහියංගනය |
| | 3. බදුල්ල |
| | 4. සොරණාතොට |
| | 5. හපුතලේ |
| | 6. පස්සර |
| 2. නුවරඑළිය ... | ... 1. නුවරඑළිය |
| | 2. මස්කෙළිය |
| | 3. කොත්මලේ |
| | 4. වලපනේ |
| | 5. ඌව-පරණගම |
| | 6. වැලිමඩ |
| 3. අනුරාධපුරය ... | ... 1. අනුරාධපුරය |
| | 2. මැදවච්චිය |
| | 3. හොරොව්පතාන |
| | 4. කැකිරාව |
| | 5. කලාවැව |
| | 6. මිහින්තලේ |
| 4. පොලොන්නරුව | ... 1. පොලොන්නරුව |
| | 2. මින්නේරිය |
| 5. අම්පාර ... | ... 1. අම්පාර |
| 6. ත්‍රිකුණාමලය ... | ... 1. ත්‍රිකුණාමලය |
| | 2. මුත්තූර් |
| 7. කල්මුනේ ... | ... 1. කල්මුනේ |
| | 2. නින්තවූර් |
| | 3. පොතුවිල් |
| 8. මඩකලපුව ... | ... 1. මඩකලපුව |
| | 2. පදිරිප්පුව |
| | 3. කල්කුඩා |
| 9. වව්නියාව ... | ... 1. වව්නියා |
| 10. මන්නාරම ... | ... 1. මන්නාරම |
| 11. යාපනය ... | ... 1. යාපනය |
| | 2. කයිට්ස් |
| | 3. උඩුපිඩ්ඩි |
| | 4. නල්ලූර් |
| | 5. කන්කසන්තුරේ |
| | 6. කිලිනොච්චි |
| | 7. චාවකච්චේරි |
| | 8. ජෙදුරුතුඩුව |
| | 9. වඩ්ඩුකොඩ්ඩෙයි |
| | 10. උඩුවිල් |
| | 11. කොපායි |
| 12. මොණරාගල | ... 1. මොණරාගල |
| | 2. බිබිල |
| 13. තංගල්ල ... | ... 1. තිස්සමහාරාමය |
| | 2. මුල්කිරිගල |
| | 3. බෙලිඅත්ත |
| 14. හලාවත ... | ... 1. නිකවැරටිය |
| | 2. පුත්තලම |
| 15. කුරුණෑගල ... | ... 1. යාපහුව |
| | 2. හිරියාල |
| 16. රත්නපුර ... | ... 1. බලංගොඩ |
| | 2. කොලොන්න |
| 17. කෑගල්ල ... | ... 1. යටියන්තොට |
| | 2. දෙහිඕවිට |
| 18 මාතර ... | ... 1. හක්මන |
| | 2. දෙනියාය |
| 29. ගාල්ල ... | ... 1. බෙන්තර-ඇල්පිටිය (අධ්‍යාපන මණ්ඩල අංක. 2) |
| | 2. හිනිදුම |
| 20. මාතලේ ... | ... 1. ලග්ගල |
| 21. මහනුවර ... | ... 1. තෙල්දෙනිය |
| | 2. මිනිපේ |
| | 3. හඟුරන්කෙත |

2. සේවයෙහි යෙදවීමෙහි නියමයන් හා සේවා කොන්දේසි :—

(i) මෙම තනතුරු ස්ථිරය. අර්ථසාධක අරමුදල් පදනමක් මත වනු ඇත. ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධ ව අරමුදලට දයක විය යුතු අතර, ඒ සඳහා රජයේ දයක මුදල ඒකාබද්ධ වැටුපෙන් 9%ක් වනු ඇත.

(ii) සියලුම පත්වීම් අවුරුදු 3ක පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් වේ.

(iii) පත්වීමක් ලබන්නා ආයතන සංග්‍රහයේ සංශෝධිත 2 වැනි පරිච්ඡේදයේ 12 : 5 සිට 12 : 13 දක්වා සහ 12 : 15 යන උපවගන්තිවල සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුය.

(iv) තෝරාගනු ලැබූ අයදුම්කරුවකු ඔහු/ඇය පත් කරනු ලබන දිස්ත්‍රික්කයේ සේවය කරන බවටත්, කවර හෝ හේතුවක් නිසා එම දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවක් ඉල්ලුම් නොකරනු ලබන බවටත් ගිවිසුමකට අත්සන් කළයුතු වේ. එහෙත් සේවයේ අවශ්‍යතාවයන් මත හෝ පරිපාලනමය වූ අන්‍ය හේතූන් මත ඔහු/ඇය වෙනත් දිස්ත්‍රික්කයකට මාරු කර යැවීමේ බලය, අධ්‍යාපන අමාත්‍යාංශය සතුව පවතිනු ඇත.

3. **මෙම තනතුරු සඳහා නියමිත ඒකාබද්ධ වැටුප.**—වර්ෂයකට රු. 5,016—11 × 144—7 × 180—රු. 7,860 කි

4. සෑම අයදුම්කරුවකු විසින්ම ඔහු/ඇය පහත සඳහන් අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම්වලින් යුක්තවන බවට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කර සිටිය යුතුයි :—

(අ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්තව සිටින බව,

(ආ) 1975 මැයි මස 15 වැනි දිනට වයස අවුරුදු 18ට අඩු හෝ අවුරුදු 35ට වැඩි හෝ නොවන බව,

(ඇ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා ඩිප්ලෝමා සහතිකය දරණ බව

(ඈ) අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කළ විටෙක ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි සූදානම් කර තබාගත යුතුය :—

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

**සැ.යු.**—මෙම සහතිකය හෝ ඒවායේ පිටපත් ඉල්ලුම් පත් සමග එවිය යුතු නොවේ.

5. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදය ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් වූ පොදු කොන්දේසි ද මීට අදාල වනු ඇත.

6. ඉල්ලුම් පත්‍ර මෙම නිවේදනයේ 1 වැනි ඡේදයේ පරිදි එවිය යුතු අතර, අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවල කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතු ය.

7. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර හා ඉහත 7 ඡේදයේ පරිදි ලැබෙන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

8. තැපැලේ දී සිදුවිය හැකි කවර හෝ ප්‍රමාදයක් මගහැරවීම සඳහා සිය ඉල්ලුම් පත් කල්වේලා ඇතිව ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලෙස අයදුම්කරුවන් වෙත මෙයින් වැඩිදුරටත් දන්වනු ලැබේ.

ප්‍රේමදස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා අධ්‍යාපන ජනරාල්.

1975 මාර්තු මස 25 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

### දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ පාසල්වල සමාජ විද්‍යා ඩිප්ලෝමා උපගුරු තනතුරු

1. මුලට පෙළපත් නාමය සහිත සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. (i) ස්ථිර ලිපිනය :————.
(ii) එය අයත් ඡන්ද කොට්ඨාශය :————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

4. විවාහක ද අවිවාහක ද යන බව :————.

5. (i) උපන් දිනය :————.
(ii) ස්ථානය :————.
(iii) 1975.05.15 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

6. (i) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
(ii) අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————.

7. ජාතිය :————.

8. ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන්ද/ලියාපදිංචි කිරීමෙන් ද යන බව :————.

9. සුදුසුකම්—

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ/පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය) විභාගය

| වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | පෙනී සිටි මාධ්‍යය | ලබා ඇති සාමාර්ථය අදාල කොටුවේ '—' සළකුණ යොදන්න | | | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශිෂ්ට | සම්මාන | සාමාන්‍ය | |
| පළමු වර | | 1. | | | | | |
| | | 2. | | | | | |
| | | 3. | | | | | |
| | | 4. | | | | | |
| | | 5. | | | | | |
| | | 6. | | | | | |
| | | 7. | | | | | |
| | | 8. | | | | | |
| දෙවන වර | | 1. | | | | | |
| | | 2. | | | | | |
| | | 3. | | | | | |
| | | 4. | | | | | |
| | | 5. | | | | | |
| | | 6. | | | | | |
| | | 7. | | | | | |
| | | 8. | | | | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

| වර්ෂය හා මාසය | විභාග අංකය | විෂයයන් | පෙනී සිටි මාධ්‍යය | ලබා ඇති සාමාර්ථය අදාල කොටුවේ '—' සලකුණ යොදන්න | | | කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශිෂ්ට | සම්මාන | සාමාන්‍ය | |
| | | 1. | | | | | |
| | | 2. | | | | | |
| | | 3. | | | | | |
| | | 4. | | | | | |

(ඇ) ගැසට් නිවේදනයේ 4 (ඇ). ඡේදය යටතේ සුදුසුකම් :

10. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඒ සම්බන්ධ විස්තර පහත සපයන්න :—

(1) දෙපාර්තමේන්තුවේ නම :————.

(2) දරණ ලද තනතුර සහ එම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ද යන බව :————.

(3) පත් වූ දිනය :———— .

(4) අස් වූ දිනය සහ අස්වීමට හේතු :————.

(5) ගුරුවරයෙක් නම් ලියාපදිංචි කිරීමේ අංකය සහ අන්තිමට සේවය කළ පාසල :————,

11. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :———

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පික විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය උඩ සේවයෙන් විශ්‍රාම ගන්නා නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සළකා නැති බවත්, මා පරම්පරාවෙන්/ලියාපදිංචි කිරීමෙන් ලාංකිකයෙකු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි)

————ගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය.

————.
දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා හෝ ඒ වෙනුවට බලය ලත් නිලධාරියාගේ අත්සන.

තනතුර :————.

ලිපිනය :————.

4–139—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ 'මොරවැව උතුර' කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කඩ්ඩුකුලම් පත්තු බටහිර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

මොරවැව උතුර, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සැහෙන දේපලක් ද, පලාත්වාසීන්ගේ සැලකිල්ලද අත්කරගෙන ඇත්තාවූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩුවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කාර්යාලය, ග්‍රාමසේවක කාර්යාලය, පලාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන සහ ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දන්වීම්වල ඇතුලත්වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1975 අප්‍රේල් මස 30 වෙනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1975 මාර්තු මස 17 දින,
ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදිය.

4–124—75.04.11 දින අංක 159 දරන ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව**
**පුරප්පාඩු**

පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :—

**1. පාලක සංගීත (සිංහල සේවය)**

(අ) රජයේ හෝ පෞද්ගලික අංශයේ විධායක තත්ත්වයේ අවුරුදු 5 ක පළපුරුද්ද සහිතව, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ උතුරු ඉන්දියානු සංගීතය පිළිබඳ ඩිප්ලෝමාවක් හා පිළිගත් ගුවන් විදුලි ආයතනයක ගුවන් විදුලි ප්‍රචාරකයකු ලෙස අඩු වශයෙන් 3 වසරක පළපුරුද්දක්

හෝ

ගුවන් විදුලි ප්‍රචාරය හා වැඩ සටහන් පාලනය පිළිබඳ අඩු වශයෙන් 10 වසරක පළපුරුද්ද සහිතව උතුරු ඉන්දියානු සංගීතය පිළිබඳ මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක් ;

(ආ) ලංකාවේ පාරම්පරික සංගීතය පිළිබඳ හොඳ දැනුමක් ;

(ඇ) සේවාවට අදල භාෂාව පිළිබඳව ඉතා උසස් දැනුමක් හා ඉංග්‍රීසි පිළිබඳ හොඳ දැනුමක් ;

(ඉ) ශ්‍රී ලංකාව හා ශ්‍රී ලංකාවේ කටයුතු එහි සංස්කෘතිය පිළිබඳ පුළුල් දැනීමක්–සාහිත්‍යමය හෝ සංස්කෘතිය පිළිබඳව මනා පසුබිමක්.

**වැටුප් ක්‍රමය.**—රු. 720—(40 × 7—50 × 4) රු. 1,200. රු. 920 ට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.

**වයස.**—අවු. 30–45 දක්වා.

2. II ශ්‍රේණියේ නිවේදක (ඉංග්‍රීසි)

(අ) ඉංග්‍රීසි භාෂාවෙන් සම තත්ත්වයේ සාමාර්ථයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක මධ්‍ය පරීක්ෂණය හෝ ඊට සමාන විභාගයක් ;

හෝ

පිළිගත් ගුවන් විදුලි ආයතනයක සහන නිවේදකයකු වශයෙන් යටත් පිරිසෙයින් 3 වසරක පළපුරුද්ද සහිතව ඉංග්‍රීසි භාෂාවෙන් ලද සාමාර්ථය ද ඇතුලුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක් ;

හෝ

වැඩ සටහන් නිවේදනය කිරීම ඇතුලුව ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ කොන්ත්‍රාත් නිලධාරියකු වශයෙන් 3 වසකට නොඅඩු අඛණ්ඩ සේවාවක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයක්.

(ආ) සේවාවට අදල භාෂාව පිළිබඳ හොඳ දැනුමක්.

(ඇ) මනා සාහිත්‍යමය හෝ සංස්කෘතික පසුබිමක්, නිර්මාණාත්මක ශක්තිය, තත්කාලීන සිදුවීම් පිළිබඳ දැනුමක්.

(ඈ) මෛක්‍රපෝනයට සුදුසු කටහඬක් හා මනා ස්වියත්වයක්, පිළිගත හැකි උච්චාරණ ශෛලියක්—මේ සියල්ල හොඳ තත්ත්වයෙන් තිබිය යුතුය.

වැටුප් ක්‍රමය.—රු. 450 (20×5—25×5) රු. 675. රු. 510 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

වයස.—අවු. 23–40 දක්වා.

3. නිෂ්පාදක—අධ්‍යාපන වැඩ සටහන් දෙමළ (ප්‍රාථමික අධ්‍යාපනය) සුදුසුකම් :

(1) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ප්‍රාථමික අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ තුන් අවුරුදු පළපුරුද්දක් සහිත දෙමළ පුහුණු ගුරු සහතිකය සහ කර්ණාට සංගීතය පිළිබඳ දැනීමක්ද ඇතුළුව නව ප්‍රාථමික අධ්‍යාපන සැලැස්මට අනුකූල සමෝධානික විෂය නිර්දේශයන්හි අවශ්‍යතාව පිළිබඳ මනා අවබෝධයක්.

(2) ඉංග්‍රීසි හා දෙමළ භාෂා පිළිබඳ මනා දැනීමක් හා නිර්මාණාත්මක රචනය (කතාන්තර හා ගීත රචනය ආදිය) පිළිබඳ හැකියාව.

(3) මනා සංගීතමය හා සංස්කෘතික පසුබිමක්.

(4) ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

වැටුප් ක්‍රමය.—රු. 525 (20×5—25×8) රු. 825. රු. 625 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

වයස.—අවු. 22–32 දක්වා.

4. නිෂ්පාදක— අධ්‍යාපන වැඩසටහන් දෙමළ (විද්‍යා)

සුදුසුකම් :

(1) යටත් පිරිසෙයින් අ.පො.ස.(සා.පෙ.) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව හා ගණිතය පිළිබඳ සාමාර්ථය සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධියක්.

(2) ලිවීම පිළිබඳ මනා හැකියාවක් සහිතව දෙමළ භාෂාව පිළිබඳ උසස් දැනුමක්.

(3) මනා සාහිත්‍යමය හා සංස්කෘතික පසුබිමක්.

(4) නව විෂය නිර්දේශ යටතේ ගුරුවරයෙකු වශයෙන් ඉගැන්වීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

(5) ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද අගේ කොට සැලැකේ.

වැටුප් ක්‍රමය.—රු. 525 (20×5—25×8) රු. 825. රු. 625 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

වයස.—අවු. 24–32 දක්වා.

රජයේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම්පත් සලකා බලනුයේ 1965 අගෝස්තු මස 20 වැනි දින අංක 666 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුවය. ඒ අනුව සංස්ථා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිලධාරියා නියත වශයෙන් සේවයෙන් මුදා හැරිය හැකිදැයි සඳහන් කළ යුතුව ඇත.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1975.05.02 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කල තැපෑලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, අධ්‍යක්ෂ ජනරාල් නමට එවිය යුතුය. ලිපි කවරයේ ඉහල වම් කෙළවර පාලක සංගීත/නිවේදක/නිෂ්පාදක යන්න පැහැදිලිව ලිවිය යුතුය.

රිප්වේ තිලකරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

1975 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹ 7.

නිදර්ශන අයදුම් පත

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

............ තනතුර සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම :—
   (1) මුල් අකුරු සහිත නම :——  —.
   (මහත්මයාද, මහත්මියද, මෙනවියද යන වග සඳහන් කරන්න.)
   (2) ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.
   (1) 1975 මැයි 2 දිනට වයස :—අවු. :————, මාස :————.

3. ජාතිය :————.

4. අධ්‍යාපන හා පුහුණුවීම :—

| ඉගෙනුම ලැබූ පාසැල් හා ආයතන | දින | සමත්වී ඇති විභාග | දැරූ වගකිව යුතු තත්ත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| | ————සිට<br>————දක්වා | | |

5. සමත්වී ඇති උසස්ම විභාගය :— (සහතික පිටපත් ඇමිණිය යුතුයි)
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.

6. පළපුරුද්ද .—(ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාලක්‍රමානුගතව යොදන්න.)

| ආයතනයේ නම | උසුලන ලද තනතුර | දින | අස්වීමට හේතුව |
|---|---|---|---|
| | | ————සිට<br>————දක්වා | |

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව :—
   (1) ————.
   (2) ————.
   (3) ————.

8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් සහ තනතුරු :—
   (1) ————.
   (2) ————.
   (3) ————.

9. වෙනත් විස්තර :————.

10. මෙම අයදුම්පතෙහි ම විසින් අඩංගු කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරාගැනීමෙදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙලිවූවහොත්, මා යෝජිත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලද පසු වරදක් හෙලිවුවහොත්, කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත්, මම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

4-197—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/83/36.

## රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)—1975 මැයි

1972 මැයි මස 19 දින හා අංක 15,011 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රජයේ ලඝු ලේඛක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ පාලනය යටතේ පවත්නා රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග අංක 117 හා 1973.03.02 වැනි දින දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපියේ සඳහන් විධිවිධාන අනුව 1975 මැයි මස 16 වැනි දින කොළඹ දී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාග, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර ඔහු විසින් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීතිවලට විභාගාපේක්ෂකයන් යටත් වේ. විභාගාපේක්ෂකයන් සඳහා වූ නීති රීති මෙම නිවේදනය අවසානයේ වෙනම පළ කර ඇත.

3. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම් පත්‍ර පිළියෙල කර ගත යුතුය. අයදුම් පත්‍රය පිළියෙල කළ යුත්තේ බාග ප්‍රමාණයේ පුල්ස් කැප් කඩදාසියක මිස අන් කිසිම ප්‍රමාණයක කඩදාසියක නොවේ. මේ සඳහා එක කඩදාසියක් පමණක් පාවිච්චි කළ යුතුය. අයදුම් පත්‍රය ටයිප් කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අපේක්ෂකයාගේම අත් අකුරින් පිරවිය යුතුය. 1975 අප්‍රේල් මස 24 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි අයදුම් පත්‍ර අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. අයදුම් පත්‍ර විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කෙරෙන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්ය සඳහා නව ප්‍රවේශක නිලධාරීහු ඔවුන්ගේ අයදුම් පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගත් භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ තමන්ගේ අයදුම් පත්‍ර පිළියෙල කිරීමට හා පිරවීමට හැක.

4. අයදුම් පත් පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග කාල සටහනේ පිටපතකුත් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. යම්කිසි විභාග අපේක්ෂකයකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකටවත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ප්‍රවේශ පත්‍රය නොලැබුණු බව පහත සඳහන් විස්තරත් සමග කොළඹ, තැ.පෙ. 1503, කොම්පඤ්ඤවීදියේ, මැලේ වීදියේ, විභාග කොමසාරිස් (විදුලි පණිවුඩ ලිපිනය : "විභාග", කොළඹ) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය :—

(1) විභාගයේ නම ;

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම ;

(3) සම්පූර්ණ ලිපිනය ;

(4) තැපැල් කාර්යාලය ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය.

5. හැඳින්වීමේ පත්‍ර.—අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී, තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම, විභාග පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත් ;

(ආ) විභාග දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු ගමන් අවසර පත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්) ;

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ පොදු සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රයක් ;

(ඉ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරන ඡායාරූපයක් :—

පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර......... (අයදුම්කරුගේ සම්පූර්ණ නම) .................යන අයගේ බව මම සහතික කරමි.

———,
අයදුම්කරුගේ පුරුදු අත්සන.

————,
(අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන)

———,
(නම සහ තරාතිරම)

දිනය :———.

(මෙම සහතික කළ ඡායාරූපය විභාග ශාලාධිපති විසින් රඳවාගනු ලැබේ)

6. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම් මත ගාස්තු අය කිරීමට තීරණය කර ඇත :—

(අ) පළමුවතාව සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාවල, සම්පූර්ණ විභාගය සඳහා රු. 15.
එක් විෂයකට ... ... රු. 7.50.

අපේක්ෂකයන් විසින් අත්සන් තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

එස්. එල්. බී. අඹුණුගම,
රා.පරි.ප.පා.ස්ව./ලේ. වෙනුවට.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ඒකාබද්ධ සේවා අංශයේ දීය.
කොළඹ 7, 1975 මාර්තු මස 25 වැනි දින.

### අයදුම්පතේ ආදර්ශ ආකෘති පත්‍රය

### රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ඇතුළත්වීමේ අයදුම්පත—1975 මැයි

විභාග අංකය :———.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

1. ඉල්ලුම්කරුගේ අගට යෙදෙන නම මුලකුරු සමග :———.
(මහතා/මහත්මිය/මෙනෙවිය) (පැහැදිලි අකුරෙන්)

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :———.

3. කාර්යාලයේ හෝ දෙපාර්තමේන්තුවේ නම සහ කාර්යාලයීය ලිපිනය :———.

4. රජයේ ලඝු ලේඛක සේවයට ඇතුළු වූ දිනය :———.

5. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා ඔබ ආදි ප්‍රවේශකයෙක් ද? නව ප්‍රවේශකයෙක් ද? :———.

6. මීට ඉහත පැවැත්වූ විභාගයකදී ලඝු ලේඛනය සහ යතුරු ලේඛනය හෝ සිංහල/දෙමළ යන විෂයයන්ගෙන් ඔබ සමත් වූයෙහිද? එසේ නම් පැවැත්වූ දිනය සඳහන් කරන්න : ———.

7. අංකය : ජී(31) සහ 1964.09.09 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපියේ විධිවිධාන ප්‍රකාර සිංහල විෂයයෙන් ඔබ නිදහස් කරන ලද්දේ නම් එසේ නිදහස් කරමින් එවන ලද ලිපියේ යොමුව සඳහන් කරන්න :———.

8. ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගය (I හෝ II). ඒ පරීක්ෂණයේ විෂයයන් හා මාධ්‍ය සඳහන් කරන්න :———.

9. මෙවර ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩ ඉඩම් විභාගය* (I හෝ II) සඳහා මීට පෙර ඔබ පෙනී සිටියේ ද ? එසේ නම් ඒ කවදාද ? :————.

10. ඉහත 9 වැනි ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා මීට පෙර මම පෙනී සිටියෙමි. මෙම ඉල්ලුම් පත්‍රයට අලවන ලද මුද්දර මවිසින් අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද ඒවා බව ප්‍රකාශ කරමි.

| මුද්දර කොටුව. | ————. විභාගාපේක්ෂකයාගේ අත්සන. |
|---|---|

දිනය :————.

*අදාළ නොවන වචන කපා හරින්න.

ම විසින් ඉහත දක්වන ලද විස්තර සත්‍ය බැව් සහතික කරමි. මේ විභාගයේ රෙගුලාසි පිළිපැදීමට එකඟවෙමි.

දිනය :————.

————.
අපේක්ෂකයාගේ අත්සන.

විභාග කොමසාරිස්.

ඉදිරිපත් කරමි.

(අ) මෙහි විස්තර දැක්වෙන *අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්,

*(ආ) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට මීට පෙර පෙනී නොසිටි බවත්,

*(ඇ) අපේක්ෂකයා/අපේක්ෂිකාව මුද්දර මුද්දරය/නිසි පරිදි අලවා අවලංගු කර ඇති බවත් සහතික කරමි.

* අනවශ්‍ය කොටස කපා හරින්න.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන සහ පදවි නාමය.

දිනය :————.

ලංකා විභාග දෙපාර්තමේන්තුව

**විභාගාපේක්ෂකයන් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේම විභාගයට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

**නීති**

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසල දීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ටද අනිත් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස සාන්තදාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔවුන්ගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නො ලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාමද තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග ශාලවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනකිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ තමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට අමුණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුයි. (එබඳු කටු වැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යාම තහනම්ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍රකර්මයෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝසෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම්ය. මේ සියලු දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කෑබලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග් පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, පයිල් කවරද, කාඩ් බෝඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදියද, විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත තමා සමීපයෙහි තබා නොගත යුතුය. මේ නීති කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නො කළ යුතු ය. වෙන අයදුම්කරුවෙකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නො දැමිය යුතුයි.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිට වී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවහොත් විභාගශාලාධිපතින්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාගශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටත යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අත්දමින් වංචා සහගත ලෙස උදව්දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ ප්‍රයෝජනය සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැල කර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර අදිරිපත් කළ යුතුය. අනන්‍යතා ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්.—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතින්ට දැන්විය යුතුය. විභාගශාලාවේදී ඔබට මා දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත තුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවලට අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින්, ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරාගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධ ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් ද බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටු වැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිවද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරු වලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබෙල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතු ය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ භාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම අසුනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

4-223—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### මීගමුව, තංගල්ල, යාපනය සහ මඩකලපුව ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන ධීවර අභ්‍යාස පාඨමාලාව—සිංහල/දෙමළ මාධ්‍යය, 1975 ජූලි

ඉහත සඳහන් ධීවර අභ්‍යාස මධ්‍යස්ථානවලදී 1975 ජූලි මාසයේ දී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ධීවර අභ්‍යාස පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මීගමුව හා තංගල්ල ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය සිංහල භාෂාව වන අතර, යාපනය හා මඩකලපුව ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයන්හි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය දෙමළ භාෂාව වේ.

2. අයදුම්කරුවන් විසින් අයදුම්පත් පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, පිළියෙල කොට තමන් තෝරා ගන්නා ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පති වෙත 1975 මැයි 10 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ යැවිය යුතුය. තැපැලේ දී හෝ වෙනයම් මොනම ක්‍රමයකින් හෝ නැති වන ඉල්ලුම්පත්‍ර ගැන වග කියනු නොලැබේ. ඒ ඒ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ විදුහල්පතිගේ ලිපිනය පහත සඳහන් වේ :—

(අ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, මීගමුව.
(ආ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, තංගල්ල.
(ඇ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, යාපනය.
(ඈ) විදුහල්පති, ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, මඩකලපුව.

3. විෂය ප්‍රමාණය හා පුහුණුවීමේ කාලය : ධීවර ආම්පන්න, මසුන් මැරීමේ ක්‍රම, එන්ජින් ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම යන මේවා පුහුණු කරවීම මෙම පාඨමාලාවට ඇතුළත් වේ. මෙම පාඨමාලාව සඳහා ගතවන කාලය දළ වශයෙන් සමසකි. එක් පාඨමාලාවක් සඳහා අභ්‍යාසලාභීන් 15 දෙනෙකුට ඉඩකඩ සැලසේ.

4. පුහුණුකිරීමේ කොන්දේසි.—(i) පුහුණුවීමේ කාලසීමාව තුළදී මීගමුව ධී.අ.ම.සේ අභ්‍යාසලාභීන්ට අභ්‍යාස මධ්‍යස්ථානයේම නතර වීමේ පහසුකම් සලසනු ලැබේ. සෙසු අභ්‍යාස මධ්‍යස්ථානවල අභ්‍යාසලාභීන්ට නතරවීමේ පහසුකම් සලසනු නොලැබේ.

(ii) පුහුණුවීම අවසන් කිරීමෙන් පසු රජය යටතේ රැකියාවක් ලබා ගැනීමේ කිසිම අයිතිවාසිකමක් පුහුණුවන්නන්ට නොමැත.

(iii) පුහුණුවීමේ කාලසීමාව තුළදී පුහුණුවන්නන් විසින් අභ්‍යාස මධ්‍යස්ථානයේ නීතිරීති පිළිපැදිය යුතුය.

(iv) පුහුණුවන්නන්ගෙන් ගාස්තු අයකිරීමක් නැත.

(v) මධ්‍යස්ථානයට අයත් අභ්‍යාස බෝට්ටු තුළ මුහුදේදී පරීක්ෂණ පවත්වා පෙන්වීම අභ්‍යාසයට ඇතුළත් වේ.

(vi) දිනකට රු. 4ක යැපීම් දීමනාවක් අභ්‍යාසලාභීන්ට ගෙවනු ලැබේ.

(vii) තෝරාගත් අයදුම්කරුවන් රු. 50ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. පාඨමාලාව අවසානයේ එම මුදල ආපසු දෙනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම් :—

(1) මෙම අභ්‍යාස පාඨමාලාව සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1975.05.10 වෙනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු බවට,

(ආ) විශිෂ්ඨ චරිතයකින් සහ හොඳ ශරීර සනීපයෙන් යුතු බවට,

(ඇ) සිංහල/දෙමළ කණිෂ්ඨය දක්වා ඉගෙනීම කර ඇති බවට,

සටහන.—උද්යෝගිමත් ධීවර කාර්මිකයින් වන්නාවූද, එවැන්නන්ගේ දරුවන් වන්නාවූද, අයදුම්කරුවන් හට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) තම අයදුම් පත් සමග ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.

(ඈ) අයදුම්කරුගේ සහ ඔහුගේ පියාගේ රැකියාවන් සඳහන් කරන ග්‍රාම සේවකයෙන් ලබාගත් සහතිකයක්.

6. නියමිත ස්ථානයකදී නියමිත වේලාවක සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන් සූදානමින් සිටිය යුතුය. මෙයට අදාල ගමන් වියදම් හෝ වෙනත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

7. අභ්‍යාස පාඨමාලාව ආරම්භ කෙරෙන දිනය ඒ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

ධීවර අධ්‍යක්ෂ.

1975 මාර්තු මස 31 වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

### අයදුම් පත්‍ර ආකෘතිය

............................ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයෙහි ධීවර අභ්‍යාස පාඨමාලාව—සිංහල/දෙමළ මාධ්‍යය—1975 ජූලි

1. නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) උපන් දිනය :————.
   (ආ) 1975.05.10 දිනට වයස :——, අවුරුදු:——, මාස:——. දින:——.

4. ජාතිය :————.

5. අයදුම්කරුගේ දැන් රැකියාව :————.

6. අයදුම්කරු රක්ෂාවෙහි නියුක්ත ස්ථානය :————.

7. අයදුම්කරු ධීවරයකු නම් :————.
   (අ) මසුන් මැරීමේ ආකාරය :————.
   (ආ) බෝට්ටුවක් සහ හෝ ආම්පන්න හිමියකු ද යන වග :————.

8. අයදුම්කරුගේ පියාගේ දැන් රැකියාව :————.

9. අයදුම්කරුගේ පියා රක්ෂාව කරන ස්ථානය :————.

10. අයදුම්කරු විවාහකද, අවිවාහකද, වැන්දඹු පුරුෂයෙක් ද යන වග (විවාහක නම් දරුවන් ගණන සඳහන් කරන්න) :—

11. අධ්‍යාපනික සුදුසුකම් :————.

12. දැනට ලබා ඇති අභ්‍යාසයන් පිළිබඳ විස්තර :————.

13. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම පිණිස යම් විශේෂ හිමිකමක් තිබේ නම්, ඒ පිළිබඳ විස්තර :————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

4-224—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඩීඑම්/4/1/183 (IV)

### ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවා ගැනීමේ විභාගය—1974

ශ්‍රී ලංකා විදේශ සේවයට අපේක්ෂකයින් බඳවා ගැනීම පිණිස 1974 දී පවත්වන ලද විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල, සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද අපේක්ෂක අපේක්ෂිකාවන් වෙත තැපැලෙන් යවා ඇත.

සම්මුඛ පරීක්ෂණයට නොකැඳවන ලද අපේක්ෂක අපේක්ෂිකාවන් තම ලකුණු ප්‍රමාණය දැන ගැනීමට කැමති නම්, කොළඹ 2, මැලේ වීදියේ, තැ. පෙ. අංක 1503 හිමි විභාග කොමසාරිස් තැන වෙත ඉල්ලුම් කිරීමෙන් එය ලබා ගත හැකිවේ.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1975 මාර්තු මස 27 වැනි දින,
කොළඹ 1, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේදී ය.

4-178—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### සැලසුම්කරුවන්ට බලපත්‍ර දීම පවත්වනු ලබන විභාගය

සැලසුම්කරුවකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට සර්වේ ජනරාල්ගේ සහතික පත්‍රය සඳහා විභාගය කොළඹදී පවත්වනු ලැබේ. විභාගය, I වැනි කොටස කණ්ඩාංක සෙවීම සහ II වැනි කොටස සැලැස්ම ඇඳීම, වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

2. විභාගයේ I වැනි කොටස 1975 ජූනි මස 7 වැනි දින පැවැත්වෙන අතර, II වැනි කොටස 1975 ජූලි මස 7 වැනි දින ආරම්භ වනු ඇත. I වැනි කොටසින් අසමත් වන අපේක්ෂකයින් II වැනි කොටසට පෙනී සිටීමට අවශ්‍ය නොවන්නේ ය.

3. අපේක්ෂකයින්ට (අ) කෝණමානය හා කණ්ඩාංක යන දෙකේ ආධාරය ඇතිව ක්ෂේත්‍ර සටහන්වලින් නිවැරදි ලෙස සැලැස්මක් ඇඳීමට හැකි බවත්, (ආ) එසේ නිවැරදි ලෙස අඳින ලද සැලැස්ම ගණන් බැලීමට හැකි බවටත් මා හට ඒත්තු ගැන්වීම අවශ්‍යය.

4. සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබීමට, අපේක්ෂකයින්, I වැනි සහ II වැනි යන කොටස් දෙකෙන්ම එකවර සමර්ථ විය යුතුය.

5. විභාගය සඳහා ඉල්ලීම් රුපියල් 12 ක ගාස්තුවක් සමග, මා වෙත ලියා ඉදිරිපත් කළ යුතුය. මුද්දර මගින් එවනු ලබන විභාග ගාස්තු භාර ගනු නොලැබේ. චැක්පත්/මුදල් ඇණවුම්/ තැපැල් ඇණවුම්, සර්වේ ජනරාල්ට ලැබෙන සේ එවිය යුතුය. මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර පෝරම සපයනු නොලැබේ. පහත සඳහන් විස්තර සැපයිය යුතුය :—

(අ) සම්පූර්ණ නම :————.

(ආ) ස්ථිර ලිපිනය :————.

(ඇ) උපන් දිනය :————.

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය සහ මාධ්‍යය :————.

(ඉ) විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය :—

6. අයදුම් පත්‍ර 1975 මැයි මස 15 වැනි දිනට පසු භාරගනු නොලැබේ.

7. අපේක්ෂකයින්ට චිත්‍ර කඩදාසි සහ කණ්ඩාංක පත්‍ර විභාගයේදී සපයනු ලැබේ. කෙසේ වෙතත් අයදුම්කරුවන් තම තමන්ගේ ඇඳීම් උපකරණ, කණ්ඩාංක ගිණීම සඳහා වගු සහ ඔවුනට අවශ්‍ය අනිකුත් උපකරණ සපයා ගත යුතුය.

8. (1) විභාගයට ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම විභාගය සඳහා තමන් පෙනී සිටින එක් එක් විෂයක් පාසා විභාග පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි, ස්වකීය අනන්‍යතාවය, ඔප්පු කළ යුතුය. මේ කාරණය සඳහා පහත සඳහන් ලියවිලි අතුරෙන් එකක් ඉදිරිපත් කළ හැකිය :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක් ;

(ආ) මෙම විභාගය පවත්වන දිනට අවුරුදු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු පාස්පෝට් බල පත්‍රයක් ;

(ඇ) මෙම විභාගය පවත්වන දිනට අවුරුදු 3 කට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක් ;

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක් අයදුම්කරුගේ අත්සන එහි පසුපිටේ යොදා එම අත්සන සහ පසු පිටේ ඡායාරූපය අයදුම්කරුගේම බව, සැලකිය යුත්තෙක් (ප්‍රවේශ පත්‍රය සහතික කිරීමට සුදුසු වර්ගයට අයත් කෙනෙක්) සහතික කළ යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් කළ යුතුය. මෙවැනි ඡායාරූප පිටපත් විභාග පරිපාලක විසින් රඳවා ගන්නවා ඇත.

(2) (I) වැනි ඡේදයේ අවශ්‍යතාවය පරිදි, තමන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් සාක්ෂියක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට, විභාගයට පෙනී සිටීම හෝ පෙනී සිටීම සඳහා අයිතිය ඉල්ලීම කළ නොහැක.

ඇස්. ජේ. මුණසිංහ,
සර්වේ ජනරාල්.

ප්‍රගති ශාඛාව,
සර්වේ ජනරාල් කාර්යාලය,
තැ. පෙ. 506, කොළඹ 5,
1975 මාර්තු මස 20 වැනි දින.

4–165—75.04.11 දින අංක 159 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

**1975**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 07.03.75 | සිකුරාද ... | 26.02.75 | බදාදා | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද ... | 05.03.75 | බදාදා | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද ... | 12.03.75 | බදාදා | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද ... | 19.03.75 | බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් ... | 04.04.75 | සිකුරාද ... | 25.03.75 | අඟහරුවාද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද ... | 02.04.75 | බදාදා | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද ... | 09.04.75 | බදාදා | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද ... | 16.04.75 | බදාදා | දවල් 12.00 |
| මැයි ... | 02.05.75 | සිකුරාද ... | 23.04.75 | බදාදා | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද ... | 30.04.75 | බදාදා | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද ... | 07.05.75 | බදාදා | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද ... | 14.05.75 | බදාදා | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද ... | 21.05.75 | බදාදා | දවල් 12.00 |
| ජූනි ... | 06.06.75 | සිකුරාද ... | 28.05.75 | බදාදා | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද ... | 04.06.75 | බදාදා | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද ... | 11.06.75 | බදාදා | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද ... | 18.06.75 | බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී